ජනවාරි 2023

# 3 ප්‍රීතිමත් වැඩිහිටියන් සඳහා වූ පුවත් පත්‍රිකාව

## දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයෙන් අගනා සහායක්



### පසුබිම :

නිවස තුළ තනිවී හුදකලා වූ වැඩිහිටියාට සිය ප්‍රශ්න , ගැටළු කතාකරන්නට අවස්ථාව ලබා දීමේ අරමුණ පෙරදැරිව 90 දශකයේ මැද භාගයේදී පමණ දිවා මධ්‍යස්ථාන සංකල්පය බිහිවිය. සමවයස් මිතුරු සමාජය තුළ සතුට, සැනසුම, විනෝදය, දැනුම ,අත්දැකීම් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් දිවා මධ්‍යස්ථාන සංකල්පය දිවයින පුරා ක්‍රියාත්මක විය.

දැනට දිවයින පුරා සක්‍රීය දිවා මධ්‍යස්ථාන 150 ක් පමණ ක්‍රියාත්මක වන අතර දිවයින පුරා විසිරී පවතින වැඩිහිටි කමිටු ජාලය හරහා වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සක්‍රියව පවත්වා ගනියි.

ගමේ ජීවත්වන වැඩිහිටියාගේ අවශ්‍යතාවය අනුව අධ්‍යාත්මික සංවර්ධනය, ගෘහස්ත ක්‍රීඩා පහසුකම්, ව්‍යායාම් හා විනෝදය මගින් නිවසට වී හුදකලාවෙන් ජීවත්වන දිවියට අර්ථයක් ලැබෙනු ඇත. නවීන තාක්ෂණික දැනුම භාවිතයට මෙන්ම සමවයස් කණ්ඩායමක් වශයෙන් රැස්වී අදහස් හුවමාරු කරගනිමින් සිය ජීවන අවශ්‍යතා සාමූහිකව සපුරා ගැනීමටත් මෙහිදී අවස්ථාව උදා වේ.

### අරමුණු

- ආධ්‍යාත්මික , සෞන්දාර්යාත්මක , සෞඛ්‍ය සම්පන්න ගෞරවනීය වැඩිහිටි දිවියක් සඳහා පසුබිම සකස්කර දීම මෙන්ම
- නිවෙසටම කොටුවී මහලු විය පිළිබව සිතමින් විවිධ රෝගී තත්ත්වයන් යටතේ හුදකලාවේ ගතකළ ඒකාකාරී දිවියට විරාමයක් තැබීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි.



## ඔබේ දිවා මධ්‍යස්ථානයෙන් වැඩිහිටි ඔබට සැලසෙන සේවා

- අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

  උදා: භාවනා, බණ, ශීල ව්‍යාපාරය, සරල යෝගී භාවනා ,දානමය පිංකම්

- අත්දැකීම් හුවමාරු වැඩසටහන්

  ➢ දැනුමැති වැඩිහිටියන් මගින් පාසල් දරුවන් හා තරුණ තරුණියන්හට දැනුම ලබාදීම (මැහුම්,ගෙතුම් යනාදී)

  උදා : කළුතර මැලැගම දිවා මධස්ථානය ලිය සවිය නමින් මැහුම් ගෙතුම් පුහුණුවක් තරුණියන් වෙත ලබා දීම.

- ක්‍රීඩා හා විනෝදාස්වාදයට අවස්ථා ලබා දීම.

  ➢ කැරම්, දාම්, කාඩ්, චෙස් වැනි ක්‍රීඩා (ගෘහස්ත ක්‍රීඩා)

  ➢ රූපවාහිනී, ගුවන් විදුලිය

- සෞඛ්‍යය

  බටහිර සහ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෛද්‍ය උපදේශන ලබා ගැනීමට බාහිර සායන සංවිධානය කෙරේ.

- වැඩිහිටි පෝෂණය

  පෝෂ්‍ය පදාර්ථ වලින් පොහොසත් ආහාර වැඩිහිටියන් විසින්ම පිළියෙළ කරන අතර දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සියලු දෙනා සමබර ආහාර වේලක් ලබා ගනී.

- පුස්තකාලය

  පොත් පත් සහ පුවත්පත් දිවා මධ්‍යස්ථානයට වැඩිහිටියන් විසින්ම ගෙන එන අතර එහිදී ඔවුන් සැමට කියවීම සඳහා පොත් එකතුවක් සකස් කර ඇත.







## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් ලැබෙන සහය

දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීමට සහ ඒවායේ තත්ත්වය වැඩිදියුණු කිරීමට දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතුව ඇත. ආධාර වර්ග දෙකක් තිබේ:

එක් දින මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා = රුපියල් මිලියන 3.5 කි
ඒක් දිවා මධ්‍යස්ථානයකට උපකරණ මිලදී ගැනීම සඳහා = රු. 500,000 කි

## ✔ අයදුම් කිරීමේ පිළිවෙල

| කාල සීමාව: ජනවාරි - මාර්තු | කාල සීමාව: මැයි | කාල සීමාව: ජූනි | කාල සීමාව: ජූලි |
|---|---|---|---|
| ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සෑම වසරකම පළමු කාර්තුවේදී අයදුම්පතක් කැඳවීම → | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන දැනුවත් කිරීම → | ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයට ඉල්ලීම් සමඟ ඇස්තමේන්තු ලබා දීම → | සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසුව චෙක්පත් නිකුත් කිරීම |

## ක්‍රියාකාරකම් වල දළ සටහන

- වසරකට උපරිම ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කෙරෙන අතර ඉල්ලුම මත අරමුදල් ලබා ගත හැකිය.
- 2022 වර්ෂයේ දිවා මධ්‍යස්ථාන සඳහා සහය දක්වන (අරමුදල්) පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිවා මධ්‍යස්ථානයේ නම | ලබාදුන් මුදල |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | ගම්පහ | කටාන | දැවමොට්ටාව - සුජාතා | 2,500,000.00 |
| 2 | | ගම්පහ | දිවුලපිටිය | කොටදෙණියාව - සරණ | 2,500,000.00 |
| 3 | | කළුතර | මතුගම | මිහිදු වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 1,500,000.00 |
| 4 | උතුරු පළාත | මන්නාරම | නානාට්ටන් | සමන්තුරේ වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 1,500,000.00 |
| 5 | වයඹ | කුරුණෑගල | නාරම්මල | යසෝදරා | 1,500,000.00 |
| 6 | | කුරුණෑගල | ගල්ගමුව | වැඩිහිටි | 1,500,000.00 |
| 7 | | කුරුණෑගල | කුලියාපිටිය බටහිර | ඉළුක්හේන වැඩිහිටි දිවා ම. | 1,500,000.00 |
| 9 | සබරගමුව | රත්නපුර | කලවාන | සැදැකිරණ වැ.දි.ම | 1,500,000.00 |
| 10 | | කෑගල්ල | කෑගල්ල | පිවිතුරු | 2,500,409.00 |
| 11 | | කෑගල්ල | දෙහිඕවිට | සමාධී | 1,500,000.00 |
| 12 | | කෑගල්ල | මාවනැල්ල | ප්‍රඥානන්ද | 682,531.50 |
| 13 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කන්තලේ | උත්තලපුර දිවා මධ්‍යස්ථානය | 1,500,000.00 |
| 14 | | අම්පාර | කල්මුණේ | පෙරිය නීලවානයි වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 500,000.00 |
| 15 | | අම්පාර | අලියාඩිවෙම්බු | ඊස්වර ජෙයෂ්ඨ පුරවැසි දිවා මධ්‍යස්ථානය | 500,000.00 |
| 16 | | මඩකළපුව | එරාවූර්පත්තු | අමිර්තකලි | 1,500,000.00 |
| 17 | | මඩකළපුව | එරාවූර් පත්තු සෙන්කලඩි | විග්නේශ්වර වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 1,500,000.00 |
| 18 | | මඩකළපුව | මන්මුනෙයි උතුර | අමිර්තහලි වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 1,500,000.00 |
| 19 | ඌව | බදුල්ල | හාලි ඇල | පැරකුම් | 1,500,000.00 |
| 20 | | මොණරාගල | මැදගම | අසරණ සරණ | 2,500,409.76 |
| 21 | මධ්‍යම | මහනුවර | උඩුදුම්බර | සමාධි | 1,500,000.00 |
| 22 | උතුරුමැද | පොළොන්නරුව | හිඟුරක්ගොඩ | හිඟුරක්ගොඩ වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 1,153,565 .00 |
| 23 | | පොළොන්නරුව | ඇළහැර | සමගි | 2,500,000.00 |
| 24 | | අනුරාධපුරය | මහවිලච්චිය | සාලිය | 1,500,000.00 |
| 25 | දකුණු පළාත | ගාල්ල | ඉමදූව | දීගොඩ - සමාධී | 3,500,000 .00 |



කපිල ලැනරෝල් මහතා
වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ

ශ්‍රී ලංකාව ශීඝ්‍රයෙන් වැඩිවන වැඩිහිටි ජනගහනයක් සිටින රටක් ලෙස පිළිගැනේ. මේ වැඩිහිටි ප්‍රජාව සමාජයට බරක් නොවීමට වග බලා ගත යුතුයි. ඒ සඳහා සැලසුම් සකස් කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සිදු කෙරේ.ඒ සඳහා වැඩිහිටි ජනතාව ආර්ථිකයට දායක කර ගැනීමේ අරමුණින් දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර, දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම මෙන්ම ස්වයං රැකියා වැඩසටහන් ද සැලසුම් කෙරිණි.එසේම, වැඩිහිටියන්ට ඩිජිටල් සාක්ෂරතාවය භාවිතා කිරීම ගැන ඇත්තේ අල්ප දැනුමකි. වැඩිහිටි ආකල්ප වෙනස් කිරීමට සහ වර්තමාන ලෝකයේ ඉදිරියට යාමට ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමේ නව වැඩසටහනක් ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය 2022 වසරේ සිට දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ආකල්ප වෙනස් කිරීම, අභිප්‍රේරණය, ඩිජිටල් සාක්ෂරතාවය හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.

පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ක්‍රියාත්මක වන නාහකොටමඩ සමනල වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය වැඩිහිටි සුබසාධනය වෙනුවෙන් කටයුතු කරන ස්ථානයක් බව මම කියන්න කැමතියි. සාමාජිකයින්ගේ කායික හා මානසික සුභසාධනය සඳහා මෙම දින මධ්‍යස්ථානය මගින් දෛනිකව සහ වාර්ෂිකව විවිධ සුබසාධන කටයුතු සිදු කරනු ලබයි. මෙම ස්ථානයට දිනපතා පැමිණීම මානසික වශයෙන් අප සැමට මහත් තෘප්තියක්. වැඩිහිටියන් වූවත් අපට සුදුසු සරල ව්‍යායාම, පෝෂණ වැඩසටහන්, ආර්ථික ශක්තිය සඳහා ස්වයං රැකියා, ආධ්‍යාත්මික සුවය සඳහා සියලු දෙනා එක්ව ධර්ම සාකච්ඡා පැවැත්වීම, වැඩිහිටියන්ගේ රසවින්දනය සඳහා පොත්පත් කියවීම, ප්‍රසංග, ජනකතා ගායනය ඇතුළු විනෝදාත්මක හෝරාවක් මෙහිදී පැවැත්වේ. වැඩිහිටියන් වන අපට ලබා දෙන සහයෝගයට මම මෙම දින මධ්‍යස්ථානයට මගේ අවංක ස්තූතිය පුද කරමි.

වැඩිහිටියන් රටට සම්පතක් කළ යුතු කාලය පැමිණ තිබේ. ලෝකය වෙනස් වෙමින් ඉදිරියට යන විට ශ්‍රී ලාංකීය අපේ වැඩිහිටි පරම්පරාව ඒ සමඟ ඉදිරියට යා යුතුයි. මේ සඳහා රටේ සංවර්ධන සැලසුම් වැඩිහිටි ප්‍රජාව කෙරෙහි යොමු විය යුතුයි. දිවා මධ්‍යස්ථාන වැඩිහිටියන්ට විනෝද වීමට සහ ඔවුන්ගේ හැකියාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය පරිසරයක් සලසා දෙන අතර ඔවුන්ව තනි නොකර තම වැඩිහිටි කාලය සාර්ථකව ගත කිරීමට සහය වේ. ඒ නිසා එම දින මධ්‍යස්ථානවලට සහයෝගය ලබා දීම ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලයෙන් සිදු කරන විශාල ක්‍රියාවක්. ඒ හරහා වැඩිහිටි පුද්ගලයා මානසිකව සහ කායිකව ශක්තිමත් වෙනවා කියලා මම විශ්වාස කරනවා.



ගයානි අනුජා පෙරේරා මහත්මිය
සමාජ සේවා නිලධාරි
NSE



R. A. P. N රාජපක්ෂ මහත්මිය
නාහකොටමඩ සමනල වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ වැඩිහිටි පුරවැසියෙක්

## වැඩිහිටි මහා ලේකම් කාර්යාලයෙහි අනාගත වැඩ සැලසුම්

වැඩිහිටි පුරවැසියන් ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම සඳහා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ අනාගත වැඩ සැලසුම් ඇත. පළමු වැඩසටහන 2022 දෙසැම්බර් 12 වන දින නාරංවිට වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයේදී ආරම්භ කිරීමට නියමිතය. ප්‍රදේශයේ බහුලව තිබෙන මඤ්ඤොක්කා සහ කොස් යොදාගනිමින් කරන නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම සහ සබන් නිෂ්පාදනය ආරම්භ කිරීමේ කටයුතු ද සංවිධානය කෙරේ.

(ඡායාරූප අදාළ පුද්ගලයන්ගේ අවසර ඇතිව ප්‍රකාශයට පත් කෙරේ)

**කරුණාකර ඔබේ ප්‍රජාව තුළ සිදු වන යහපත් ක්‍රියාකාරකම් jica.procees@gmail.com වෙත යවන්න**

තරුණ, වැඩිහිටි සහ ආබාධිත අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘති කාර්යාලය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය (NSE),
ලිපිනය: D බ්ලොක්, 2 වන මහල, සෙත්සිරිපාය අදියර (II), බත්තරමුල්ල, කොළඹ
විද්‍යුත් තැපෑල: jica.procees@gmail.com